## විවිධ හැඟීම් හා අවස්ථාවන්ට උචිත පරිදි අර්ථාන්විත ව සංවාද හා ශබ්ද භාවිත කරයි.

ඔබ සතු විවිධ හැඟීම්, එය ප්‍රකාශ කරන අවස්ථාවන් අනුව වෙනස් වෙයි. නාට්‍යයක දී චරිතයේ සංවාද ඉදිරිපත් කරන විට සංවාද වල ඇති විවිධ උච්චාරණ රටා හඳුනාගෙන ඒ අනුව සංවාදය ඉදිරිපත් කළ යුතුය. සංවාදය විවිධ හැඟීම් වලින් ඉදිරිපත් කරන විට අදහස වෙනස් වෙයි.

එකම සංවාදය

- තරහ
- සතුට
- ලැජ්ජාව
- කෝපය
- දුක

ආදී හැඟීම් වලින් ඉදිරිපත් කළ හැක.

ඊට අමතරව නාට්‍ය සඳහා විවිධ හඬවල් ද යොදාගත හැක. නාට්‍යයේ අවස්ථාවට අනුව එය වෙනස් වේ. නාට්‍යට ගැලපෙන පරිදි මෙම හඬ භාවිත කිරීම වැදගත් වේ. සාමාන්‍ය ජීවිතයේ මිනිසා විවිධ අවස්ථාවල දී විවිධ භාණ්ඩ වලින් ශබ්ද ලබා ගනී. ශබ්ද දෙයාකාර වේ.

- ස්වාභාවික ශබ්ද

  හෙණ හඬ, කුරුළු ගී, ගස් සෙළවෙන හඬ

- මිනිසා ඇතිකරන කෘතිම ශබ්ද

  නළා පිඹීම, අත්පුඩි, හක්ගෙඩිය පිඹීම, වෙඩි හඬ

මෙවැනි ශබ්ද වේදිකා නාට්‍ය නිර්මාණ සඳහා ද යොදාගත හැක. නාට්‍ය වල දී සංවාදයක් වඩා ප්‍රබල වීම සඳහා විවිධ හඬ භාවිත කරයි. එමගින් හැඟීම වඩා ඉස්මතු කළ හැක.

එමෙන්ම වේදිකාව මත මැවිය නොහැකි සිද්ධි, හඬ යොදා ගනිමින් එකී හැඟීමම ඇතිකළ හැක.

කුණාටුවක හඬ, වර්ෂාවක හඬ

අපට විවිධ භාණ්ඩ උපයෝගී කරගෙන මෙවැනි හඬ නිර්මාණය කරගත හැක. ඒ සඳහා හඬ හඳුනාගැනීමට අපට සිදුවේ.

ක්‍රියාකාරකම : ඔබේ දෑස් පියාගෙන හඬ හඳුනා ගැනීමට උත්සහ කරන්න.

- එක්ස් රේ කොළ මගින් අකුණු හඬ
- ජලය වත්කරන හඬ
- අත්පුඩි හඬ
- වෙඩි හඬ
- මගුල් බෙර හඬ
- චණ්ඩ මාරුතයක හඬ
- කෝකිල හඬ

නාට්‍ය නිෂ්පාදනයේ දී අපට මෙම හඬ මනාව යොදා ගැනීම මගින් නාට්‍යයේ අර්ථය වඩාත් තීව්‍ර කරගත හැක.

පැවරුම :

නාට්‍යක ශබ්ද උත්පාදනයට ගතහැකි ආදේශන භාණ්ඩ කිහිපයක් ලියන්න.